# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2018 අංක 12 දරන සිවිල් ගුවන් සේවා (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 2018 මැයි මස 21 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2018 මැයි මස 25 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකි ය.

**මිළ :** රු. 8.00 යි. **තැපැල් ගාස්තුව :** රු. 10.00 යි.

මෙම පනත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

2018 අංක 12 දරන සිවිල් ගුවන් සේවා
(සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2018 මැයි මස 21 වන දින]

එල්.ඩී.— ඕ. 7/2017

**2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

කෙටි නාමය.

**1.** මේ පනත 2018 අංක 12 දරන සිවිල් ගුවන් සේවා (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනතට අලුතින් 18අ වගන්තිය ඇතුළත් කිරීම.

**2.** 2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනතේ 18 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එකී වගන්තිය එම ප්‍රඥප්තියේ 18අ වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය:—

"ගගන යාත්‍රාංගනයක් තුළ තැරැව් කිරීමේ වරද.

18අ. (1) ගගන යාත්‍රාංගනය තුළ රැඳී සිටීම සඳහා යථා පරිදි බලය පැවරීමක් නොමැතිව එකී පරිශ්‍රය ඇතුළත රැඳී සිටිමින් පැමිණෙන හෝ පිටව යන යම් ගුවන් මගියකුට තැරැව් කිරීමෙහි නියුතුව සිටින බවට 6 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ පත් කරන ලද සේවා සැපයුම්කරුවකුගේ ගුවන් සේවා ආරක්ෂක සේවා සපයන සේවා නියුක්තයකු විසින් හෝ රාජකාරියෙහි යෙදී සිටින පොලිස් නිලධරයකු විසින් සොයාගනු ලබන සැම තැනැත්තකුම වරදකට වරදකරු වන අතර, අවස්ථාවෝචිත පරිදි, එම තැනැත්තාව, පොලිස් නිලධරයා විසින් සිරභාරයට ගැනීම හෝ සේවා සැපයුම්කරුගේ ගුවන් සේවා ආරක්ෂක සේවා සපයන සේවා නියුක්තයකු විසින් අල්ලා පොලිස් නිලධරයකුට බාරදීම හෝ කරනු ලැබිය හැකි ය:

එසේ වුව ද, පැමිණෙන හෝ පිටව යන යම් ගුවන් මගියකුට, එම ගුවන් මගියාගේ පවුලේ යම් සාමාජිකයකු විසින් හෝ මිතුරකු විසින් නැතහොත් තත්කාර්ය සඳහා සේවා සැපයුම්කරුවකු විසින් බලය

2—PL 010703—2,877 (2018/04)

පවරා ඇති ආගන්තුක සත්කාර ව්‍යාපාරයේ ආගන්තුක සත්කාර සේවා සහායකයකු හෝ නියෝජිතයකු හෝ අනුයෝජිතයකු විසින් ප්‍රවාහන පහසුකම් සැපයීම, නැවතීමේ පහසුකම් සැපයීම හෝ ගමන් මලු හෝ භාණ්ඩ යම් වාහනයකට පැටවීම හෝ ඉන් බෑම වැනි යම් සේවා සැපයීමක් මගින් වරදක් සංයුක්ත නොවන්නේ ය.

(2) (1) වන උපවගන්තිය ප්‍රකාරව සිරභාරයට ගනු ලැබූ හෝ අල්ලා පොලිස් නිලධරයට බාරදෙනු ලැබූ සෑම තැනැත්තකුම, එම පොලිස් නිලධරයා විසින්, හැකි ඉක්මනින්, වරද සිදුකරනු ලැබුවේ යයි සැලකෙන ප්‍රදේශය සඳහා අධිකරණ බලය ඇති මහෙස්ත්‍රාත්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(3) 107 වන වගන්තියේ (2) වන සහ (3) වන උපවගන්තිවල විධිවිධානවල කුමක් සඳහන් වුව ද, මේ වගන්තිය යටතේ වූ යම් වරදක් සඳහා යම් තැනැත්තකුට එරෙහිව නඩු කටයුත්තක් ආරම්භ කරනු ලැබිය හැකි අතර, එම තැනැත්තා වරදකරු කිරීමේ දී රුපියල් විසිපන් දහසකට නොවැඩි දඩයකට හෝ මාස හයකට නොවැඩි කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමකට හෝ එම දඩය හා බන්ධනාගාරගත කිරීම යන දෙකටම ඔහු යටත් විය යුතු ය.

(4) මේ වගන්තියේ කාර්ය සඳහා,-

“ආගන්තුක සත්කාර ව්‍යාපාරය” යන්නෙන්, සංචාරක කර්මාන්තයට අදාළ හෝ ආනුෂංගික යම් ව්‍යාපාර කටයුත්තක් හෝ සේවාවක් අදහස් වේ; සහ

“තැරැව් කිරීම” යන්නෙන්, පැමිණෙන හෝ පිටව යන ගුවන් මගියකුට ප්‍රවාහන පහසුකම් හෝ නැවතීමේ පහසුකම් සැපයීම හෝ එම ගුවන් මගියාගේ ගමන් මලු හෝ වෙනත් භාණ්ඩ වාහනයකට

”



පැටවීම හෝ ඉන් බෑම හෝ ඊට සමාන යම් සේවාවක් ලබාදීම සඳහා තත්කාර්ය සඳහා යථා පරිදි බලය පැවරීමක් නොමැතිව, යම් ප්‍රතිෂ්ඨාවක් මත හෝ අන්‍යාකාරයකට, සිදු කිරීමට විමසීම් කිරීම අදහස් වේ.”.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**3.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත්, අංක 118, දෙස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 08,
රජයේ මුද්‍රණාලයේ පිහිටි "ප්‍රකාශන පියස" හි දී මිල දී ගත හැකි ය.